අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | **අ. පො. ස. සාමාන්‍ය පෙළ** | **2024 (2025)**

# අනුහුරු ප්‍රශ්න පත්‍රය
# Practice Paper

# Geography
# භූගෝල විද්‍යාව



**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

Nenasa

The National e-learning Portal for The General Education

**දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 61 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தரப்) பரீட்சை - பயிற்சி வினாத்தாள் - 2024 (2025)
G. C. E. Ordinary Level Examination – Practice Question Paper - 2024 (2025)

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## භූගෝල විද්‍යාව I

**උපදෙස්:**

❁ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.

❁ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූල ව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තීත් ඉර මත ලියන්න.**

**1.** සාගරික කබොල .......................................... පාෂාණවලින් සමන්විත වේ.
(බැසෝල්ට් / ග්‍රැනයිට් / ඩොලරයිට්)

**2.** ෆෝක්ලන්ඩ් දූපත් .......................................... සාගරයෙහි පිහිටා ඇත.
(පැසිෆික් / අත්ලාන්තික් / ඉන්දියන්)

**3.** නොරින් 10 යනු වැඩි දියුණු කරන ලද .......................................... ප්‍රභේදයකි.
(වී / තිරිඟු / ඉරිඟු)

**4.** මාකඳුර කාබනික පොහොර මධ්‍යස්ථානය .......................................... දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.
(රත්නපුර / කළුතර / කුරුණෑගල)

**5.** පොම්පෙයි නගරය සහමුලින් ම විනාශ කරමින් .......................................... ගිනිකන්ද විදාරණය විය.
(විසූවියස් / පේලි / එට්නා)

- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් **'නි'** යන්න වටා ද, වැරදි නම් **'වැ'** යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** කපුපිළි කර්මාන්තය කෘෂිපාදක අමුද්‍රව්‍ය මත පදනම් වී ඇත. නි / වැ

**7.** මිරිදිය ජලයෙන් 79% ක් අයිස් තට්ටු හා ග්ලැසියර් වේ. නි / වැ

**8.** ශ්‍රී ලංකාවේ මිනිරන් නිෂ්පාදනයෙන් 3% ක් පමණ දේශීය පරිභෝජනයට යොදාගනු ලැබේ. නි / වැ

**9.** නැගෙනහිර ආසියාතික වෙරළට ඔබ්බෙන් වූ පැසිපික් සාගරයේ ඇතිවන සුළිසුළං ‘විලිවිලීස්’ නමින් හඳුන්වයි. නි / වැ

**10.** දඹදෙණිය බුලත් අපනයනය සඳහා දියුණු කරන ලද අපනයන ගම්මානයකි. නි / වැ

- අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** මයික්‍රෝ වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලාව .......................................... ප්‍රදේශයේ පිහිටා ඇත.

**12.** ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාප අතර ඇති කුඩාම සංචාරක කලාපය .......................................... යි.

**13.** කිරිගව සම්පත් මධ්‍යස්ථානය ............................................... ප්‍රදේශයේ පිහිටුවා ඇත.


**14.** පෘථිවි ශිලාගෝලය විශාල භූ තැටි ............................................... කින් සමන්විත වේ.

**15.** වලාකුළු සහ අවකාශය අතර සිදුවන විදුලි විසර්ජනය ............................................... ලෙස හඳුන්වයි.

**16.** ගංමෝය හා කලපු ආශ්‍රිත ව ............................................... ධීවර කර්මාන්තය සිදු කරයි.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.

**ආර්ථික කටයුතුවල නිරත නොවන ජනගහනය පළාත් අනුව - 2012**




මූලාශ්‍රය : ජන සංගනන වාර්තාව, 2012

**17.** ආර්ථික කටයුතුවල නිරත නොවන ඉහළ ම ජන සංඛ්‍යා ප්‍රතිශතය ................ ................... පළාතෙන් වාර්තා වේ.

**18.** ආර්ථික කටයුතුවල නිරත නොවන අවම ජන සංඛ්‍යා ප්‍රතිශතයක් ඇත්තේ ........ ............................ පළාතේ ය.

**19.** උතුරු හා උතුරු මැද පළාත්වල ආර්ථික කටයුතුවල නිරත නොවන මුළු ජන සංඛ්‍යා ප්‍රතිශතය .................................... කි.

- අංක **20** සිට **24** තෙක් දී ඇති ප්‍රශ්නවල **'අ'** සහ **'ආ'** යනුවෙන් තීරු දෙකක් දැක්වේ. **'අ'** තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව **'ආ'** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

**20.**

| **'අ'** විල | **'ආ'** විශේෂත්වය |
|---|---|
| 1. සුපීරියර් | A - උසින් ම පිහිටි විල |
| 2. ටිටිකාකා | B - කරදිය පිරුණු විල |
| 3. කැස්පියන් | C - විශාලත ම විල |
| | D - ගැඹුරු ම මිරිදිය විල |

(1) A, B, C (2) A, B, D (3) C, A, B (4) D, A, C (.......)

**21.**

| **'අ'** බෝග වගාව | **'ආ'** ඉහළ ම ව්‍යාප්ති දිස්ත්‍රික්කය |
|---|---|
| 1. රබර් | A - මාතර |
| 2. තේ | B - කළුතර |
| 3. පොල් | C - නුවරඑළිය |
| | D - කුරුණෑගල |

(1) A, C, D (2) B, C, D (3) C, B, D (4) D, C, B (.......)

22. 'අ' 'ආ'

| 'අ' ක්ෂේත්‍රය | 'ආ' ප්‍රවණතාව |
|---|---|
| 1. නිෂ්පාදනය | A - අතුරු බෝග වගාව |
| 2. තාක්ෂණය | B - එකෝසවුන්ඩර් (Echo Sounder) භාවිතය |
| 3. වෙළඳාම | C - කෘෂි වසංගත |
| | D - නවීන ඇසුරුම් ක්‍රම භාවිතය |

(1) A, B, D (2) B, C, D (3) C, B, A (4) C, B, D (…….)

23.

| 'අ' පාෂාණ වර්ගය | 'ආ' භාවිතය |
|---|---|
| 1. නයිස් | A - පොහොර නිෂ්පාදනය |
| 2. හුණුගල් | B - ප්‍රතිමා නිර්මාණය |
| 3. මිනිරන් | C - සිමෙන්ති නිෂ්පාදනය |
| | D - ලිහිසි ද්‍රව්‍ය නිෂ්පාදනය |

(1) A, C, D (2) B, C, D (3) C, A, B (4) D, C, B (…….)

24.

| 'අ' ඛනිජ වැලි වර්ගය | 'ආ' ව්‍යාප්ත ප්‍රදේශ |
|---|---|
| 1. ඉල්මනයිට් | A - මීරිගම |
| 2. සර්කෝන් | B - නිලාවෙලි |
| 3. සිලිකා | C - මාරවිල |
| | D - පුල්මුඩේ |

(1) A, B, C (2) B, C, D (3) C, A, B (4) D, A, C (…….)

- අංක **25** සිට **36** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

**25.** ශ්‍රී ලංකාවේ පාංශු වර්ධන ක්‍රියාවලියේ දී වැදගත් ම වන සාධකය දැක්වෙන වරණය තෝරන්න.
(1) වර්ෂාපතන ප්‍රමාණය (2) වෘක්ෂලතා වැස්ම
(3) භූ විෂමතාව (4) ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය
(…….)

**26.** සංවර්ධනය මැනීම සඳහා භාවිත කළ පැරණි මිනුමක් වන්නේ,
(1) ප්‍රතිශීර්ෂ දළ ජාතික නිෂ්පාදිතය යි. (2) භෞතික ජීවන තත්ත්ව දර්ශකය යි.
(3) මානුෂ සංවර්ධන දර්ශකය යි. (4) මානුෂ පීඩක දර්ශකය යි.
(…….)

**27.** ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධන ව්‍යාපෘතියකට අයත් වැඩසටහනක් දැක්වෙන වරණය මින් කුමක් ද?
(1) ඇළඑළ කම්හල් 200 ව්‍යාපෘතිය (2) දිවිනැගුම ව්‍යාපෘතිය
(3) ප්‍රජා මූලික ජල ව්‍යාපෘතිය (4) පැල්පත් ඉවත් කිරීමේ වැඩසටහන
(…….)

**28.** ලෝහමය ඛණිජ, ඉන්ධනමය ඛණිජ සහ ලෝහමය නොවන ඛණිජ නිවැරදි ව පිළිවෙළින් අඩංගු වරණය වන්නේ මින් කුමක් ද?
(1) මැංගනීස්, ගල් අඟුරු, මිනිරන් (2) යපස්, ගල් අඟුරු, මැංගනීස්
(3) යපස්, හුණුගල්, තඹ (4) තඹ, ඛනිජ තෙල්, සිලිකා
(…….)

**29.** ජෛව විවිධත්වය හීන වී පස නිසරු වීමට බලපාන ප්‍රධානත ම හේතුවක් වන්නේ,
(1) ඛණිජ ලබා ගැනීම සඳහා පතල් කැණීමයි. (2) ඒක බෝග වගාව සිදු කිරීම යි.
(3) අවිධිමත් ලෙස ජනාවාස ඉදි කිරීම යි. (4) ප්‍රති වන වගා වැඩසටහන් සිදුකිරීම යි.
(…….)

**30.** නිවර්තන වර්ෂා වනාන්තර ව්‍යාප්ත ව **නොමැති** ප්‍රදේශයක් අඩංගු වරණය කුමක්ද?
(1) ඇමසන් ද්‍රෝණිය (2) මධ්‍යම ඇමරිකාව
(3) දකුණු චීනය (4) කොංගෝ ද්‍රෝණිය
(…….)

**31.** රේගු, ධීවර, සංක්‍රමණ හා සනීපාරක්ෂක නීතිරීති කඩ කිරීම වැළැක්වීම සඳහා රජයට පූර්ණ අයිතියක් ඇති සාගර කලාපය වන්නේ,
(1) ඓතිහාසික ජල ප්‍රදේශය යි. (2) රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශය යි.
(3) පරම ආර්ථික කලාපය යි. (4) යාබද කලාපය යි. (…….)

**32.** පහත සඳහන් ප්‍රකාශ හා සම්බන්ධ නිවැරදි වරණය කුමක්ද?
A - ශාක පත්‍ර තුළ ඇති ජලය වාෂ්පීකරණයට ලක් වී ඉහළ නගියි.
B - වර්ෂණය මගින් ලැබෙන ජලය සම්පූර්ණයෙන් ම අපධාවයට ලක් වේ.
C - ළිං පෝෂණය කරන්නේ අපධාවය වන ජලය යි.
D - ජල චක්‍රය තුළ ජලය ඝන, ද්‍රව සහ වායු වශයෙන් පැවතිය හැකි ය.
(1) A පමණක් නිවැරදි ය. (2) A සහ C පමණක් නිවැරදි ය.
(3) B සහ D පමණක් නිවැරදි ය. (4) D පමණක් නිවැරදි ය. (…….)

**33.** මුළු ගොඩබිම් ප්‍රමාණයෙන් 20% කට ආසන්න ප්‍රතිශතයක් ඇති මහාද්වීපය වන්නේ මින් කුමක් ද?
(1) ආසියාව (2) අප්‍රිකාව
(3) යුරෝපය (4) උතුරු ඇමරිකාව (…….)

**34.** ලෝකයේ කිරිපට්ටි පාලනය බහුල ව සිදු කෙරෙන යුරෝපා රටක් දැක්වෙන වරණය තෝරන්න.
(1) ඉතාලිය (2) පෘතුගාලය
(3) ඩෙන්මාර්කය (4) බල්ගේරියාව (…….)

**35.** ඇ. එ. ජනපදයේ මෝටර් රථ නිෂ්පාදන මධ්‍යස්ථාන පමණක් දැක්වෙන පිළිතුර දැක්වෙන වරණය තෝරන්න.
(1) ඩෙට්රොයිට්, නව එංගලන්තය, පිට්ස්බර්ග්
(2) කුෂ්නෙට්ස්ක්, මොස්කව්, යූරල් කලාපය
(3) බර්මිංහැම්, දකුණු වේල්සය, ලැන්කෂයර්
(4) ග්ලාස්ගෝ, ෂංෂුවාන්, කියොතෝ (…….)

**36.** බස්නාහිර පළාතේ ඇති වී පර්යේෂණායතනයක් වන්නේ මින් කුමක් ද?
(1) ගන්නෝරුව (2) බතලගොඩ
(3) මහඉලුප්පල්ලම (4) බෝඹුවල (…….)

- පහත **A , B , C** සහ **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **37** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A** - 1. පාරිසරික සමතුලිතතාව
2. වන විනාශය

**B** - 1. මුහුදු මට්ටමේ සිට උස
2. වායු පීඩනය

**C** - 1. පුනර්ජනනීය බලශක්ති භාවිතය
2. න්‍යෂ්ටික අත්හදා බැලීම්

**D** - 1. මානව ක්‍රියාකාරකම්
2. ආපදාවල තීව්‍රතාව

**37.** දෙවැන්නේ වැඩිවීම සඳහා පළමුවැන්නේ අඩු වීම බලපාන මාතෘකා යුගලය දැක්වෙන පිළිතුර මින් කුමක් ද?
(1) A (2) B (3) C (4) D (…….)

**38.** පළමුවැන්න වැඩි වන විට දෙවැන්න වැඩි වන සහ පළමුවැන්න අඩු වන විට දෙවැන්න අඩු වන මාතෘකා යුගලය මින් කුමක් ද?
(1) A (2) B (3) C (4) D (…….)

**39.** දෙවැන්නේ අඩු වීම පළමුවැන්නේ වැඩි වීමට බලපාන මාතෘකා යුගලය වන්නේ මින් කුමක් ද?
(1) A (2) B (3) C (4) D (…….)

**40.** පළමුවැන්න සහ දෙවැන්න අතර සබඳතාවක් නොමැති මාතෘකා යුගලය මින් කුමක් ද?
(1) A (2) B (3) C (4) D (…….)

❁ ❁ ❁ ❁

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 61 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2024 (2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - மாதிரித் தேர்வுத் தாள் - 2024 (2025)**
**G. C. E. Ordinary Level Examination – Model Question Paper - 2024 (2025)**

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

## භූගෝල විද්‍යාව II

- මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- **I** කොටසේ **01** ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- **II** කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

## I කොටස

1. **(අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.**

- අංක **(i)** හා **(iv)** දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

**i.** අංක ① න් දැක්වෙන ස්වාභාවික වෘක්ෂලතා වර්ගය වන්නේ මින් කුමක් ද?
(තෘණ බිම / වගුරු බිම / කඩොලාන) (ලකුණු 01)

**ii.** අංක ② න් දැක්වෙන රේඛාව කුමක් ද?
(සම ගැඹුරු රේඛාව / සම වර්ෂා රේඛාව / සමෝච්ඡ රේඛාව) (ලකුණු 01)

**iii.** අංක ③ න් දක්වා ඇති පරිපාලන මායිම කුමක් ද ?
(දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස / ග්‍රාම නිලධාරී කොට්ඨාස) (ලකුණු 01)

**iv.** සිතියම් ප්‍රදේශය තුළ රෝස වර්ණයෙන් නිරූපණය කර ඇත්තේ කුමන ලක්ෂණයක් ද?
(රක්ෂිත ප්‍රදේශ / ඉදිකළ ප්‍රදේශ / ආයෝජන කලාප) (ලකුණු 01)

**v.** අංක ④ න් දැක්වෙන ලක්ෂණය කුමක් ද ? (ලකුණු 01)

**vi.** අංක ⑤ සලකුණින් දක්වා ඇත්තේ කුමක් ද? (ලකුණු 01)

**vii.** අංක ⑥ න් දැක්වෙන බෝග වර්ගය නම් කරන්න. (ලකුණු 01)

**viii.** අංක ⑦ චතුරස්‍රයෙන් දක්වා ඇති කොටස තුළ සිදු කළ හැකි ආර්ථික කටයුත්තක් නම් කරන්න. (ලකුණු 01)

- පහත ප්‍රකාශ නිවැරදි නම් **'නි'** යන්න ද, වැරදි නම් **'වැ'** යන්න ද පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න.

**ix.** සිතියම් ප්‍රදේශය තුළ බහුතරයක් ඉස්ලාම් ආගමිකයන් වාසය කරයි. (ලකුණු 01)

**x.** අංක ⑧ චතුරස්‍රය තුළ රේඛීය ජනාවාස ව්‍යාප්ත ව ඇත. (ලකුණු 01)

**(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.**

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

**(i)** කැලිෆෝනියා - A - B - C
**(ii)** ටිමෝර් මුහුද - D - E - F
**(iii)** කයිරෝ නගරය - G - H - I
**(iv)** තස්මේනියාව - K - L - M
**(v)** ක්‍රැකටෝවා යමහල - P - Q - R


**(ඉ)** ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර**,** පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**.** පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න**.**

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

**(i)** මාතලේ දිස්ත්‍රික්කය - A - B - C
**(ii)** ආරුගම්බේ වෙරළ - D - E - F
**(iii)** ලක්විජය තාප බලාගාරය - G - H - I
**(iv)** පලාලි ගුවන් තොටුපල - L - M - N
**(v)** මිද්දෙනිය - P - Q - R

## II කොටස

2. පෘථිවි වායුගෝලයේ ස්තර දැක්වෙන පහත රූපසටහන ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) මෙම රූපසටහනට අනුව A හා D ස්තර **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (a) අහිතකර සූර්ය විකිරණ පාලනය කරන වායුව අන්තර්ගත වන ස්තරයේ අක්ෂරය හා නම නිවැරදි ව සඳහන් කරන්න.
(b) C ස්තරයේ විශේෂ ලක්ෂණ **දෙකක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) වායුගෝලය දූෂණය වීමට බලපාන ස්වාභාවික ක්‍රියාවලියක් හා මානුෂ ක්‍රියාවලි **දෙකක්** නම් කර, ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

3. (i) කිරි ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) සෞම්‍ය කලාපීය රටවල කිරිපට්ටි පාලනය වැඩි වශයෙන් ව්‍යාප්ත වීමට බලපා ඇති සාධක **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)
(iii) (a) වර්තමාන ශ්‍රී ලංකාවේ ධීවරයන් මුහුණ දෙන ගැටළු **දෙකක්** සඳහන් කරන්න.
(b) ධීවර කර්මාන්තය නගා සිටුවීම ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත්වන ආකාර **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

4. (i) එකලස් කිරීමේ කර්මාන්තයක් යනු කුමක් දැයි හඳුන්වන්න. (ලකුණු 02 යි)
(ii) වර්තමානයේ මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රමුඛ ආසියාතික රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(iii) (a) ශ්‍රී ලංකාවේ මෝටර් රථ කර්මාන්තය මුහුණ දෙන අභියෝග **දෙකක්** සඳහන් කරන්න.
(b) ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කර්මාන්ත අංශයෙන් ලැබෙන දායකත්වය පහත මාතෘකා **දෙක** යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න.

- සේවා නියුක්තිය
- විදේශ විනිමය ඉපැයීම (ලකුණු 05 යි)

5. (i) ලෝක ජන සංඛ්‍යාව පිළිබඳ සලකා බැලීමේ දී මිනිසාට,

(a) උපතින් හිමිවන **ලක්ෂණයක්**,

(b) උපතින් පසු උරුම කරගනු ලබන **ලක්ෂණයක්** බැගින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ලෝකයේ ජනාධික කලාප බිහිවීමට බලපෑ සාධක **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)


(iii) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහයේ හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ **දෙකක්** නම් කර, ඉන් **එක්** කරුණක් රටේ ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

6. (i) ශ්‍රී ලංකාවේ ජල ගැලීම්වලට නිරතුරුව ම ලක්වන ගංගා ආශ්‍රිත නාගරික ප්‍රදේශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ජලගැලීම් ආපදාව අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) ජලගැලීම් අවස්ථාවක දී ආපදා කළමනාකරණ චක්‍රයේ ප්‍රතිචාර දැක්වීමේ අවස්ථාව තුළ අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **දෙකක්** උදාහරණ සහිත ව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

7. ලෝකයේ දේශගුණික කලාප දැක්වෙන පහත සිතියම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ඉහත සිතියමෙ හි **'A'** හා **'B'** අක්ෂරවලින් දක්වා ඇති දේශගුණ කලාපවලට සුවිශේෂී වූ දේශගුණ වර්ගය බැගින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) **'C'** දේශගුණ කලාපය තුළ මානව කටයුතු සීමා වීමට හේතු වූ සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා ඇතිවන පාරිසරික බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(b) දේශගුණ වෙනස්වීම් අවම කිරීමට ගෝලීය වශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

8. (i) බලශක්තිය නිපදවීම සඳහා ශ්‍රී ලංකාවේ භාවිත කරන ප්‍රධාන බලශක්ති ප්‍රභව **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත ගංගා ආශ්‍රිත ව ඉදි කර ඇති විදුලි බලාගාරය බැගින් නම් කරන්න.

(a) වලවේ ගඟ


(b) ගල් ඔය

(c) මහවැලි ගඟ (ලකුණු 03 යි)

(iii) විකල්ප බලශක්ති භාවිතය රටක සංවර්ධනය කෙරෙහි බලපාන ආකාර **දෙකක්** නිදසුන් සහිත ව විස්තර කරන්න. (ලකුණු 05 යි)

❃ ❃ ❃ ❃

අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2024 (2025)




Scale 1:50,000

භූගෝල විද්‍යාව - II

**Geography - II**

1· (අ)

(i) ------------------------------------------------------------------------------------------

(ii) ------------------------------------------------------------------------------------------

(iii) ------------------------------------------------------------------------------------------

(iv) ------------------------------------------------------------------------------------------

(v) ------------------------------------------------------------------------------------------

(vi) ------------------------------------------------------------------------------------------

(vii) ------------------------------------------------------------------------------------------


(viii) ------------------------------------------------------------------------------------------

(ix) ------------------------------------------------------------------------------------------

(x) ------------------------------------------------------------------------------------------

/10

(ආ)




(i)

(ii)


(iii)

(iv)

(v)

5

(ඉ)




(i)

(ii)

(iii)

(iv)

(v)

5

1. අ. $\overline{10}$ + ආ. $\overline{5}$ + ඉ. $\overline{5}$ = $\overline{20}$

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2024 (2025)

## අනුහුරු ප්‍රශ්න පත්‍රය
## Practice Paper

# Geography
# භූගෝල විද්‍යාව



**Question Paper - I, II | පිළිතුරු පත්‍රය , II (සිංහල මාධ්‍යය)**

The National e-learning Portal for The General Education

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 61 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தரப் பரீட்சை - பயிற்சி வினாத்தாள் - 2024 (2025)
**G. C. E. Ordinary Level Examination – Practice Question Paper - 2024 (2025)**

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| **Geography** | I, II |

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## භූගෝල විද්‍යාව I

**උපදෙස්:**

❁ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.

❁ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූල ව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** සාගරික කබොල ......බැසෝල්ට්...... පාෂාණවලින් සමන්විත වේ.
(බැසෝල්ට් / ග්‍රැනයිට් / ඩොලරයිට්)

**2.** ෆෝක්ලන්ඩ් දූපත් ......අත්ලන්තික්...... සාගරයෙහි පිහිටා ඇත.
(පැසිෆික් / අත්ලාන්තික් / ඉන්දියන්)

**3.** නොරින් 10 යනු වැඩි දියුණු කරන ලද ......තිරිඟු...... ප්‍රභේදයකි.
(වී / තිරිඟු / ඉරිඟු)

**4.** මාකඳුර කාබනික පොහොර මධ්‍යස්ථානය ......කුරුණෑගල...... දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.
(රත්නපුර / කළුතර / කුරුණෑගල)

**5.** පොම්පෙයි නගරය සහමුලින් ම විනාශ කරමින් ......විසූවියස්...... ගිනිකන්ද විදාරණය විය.
(විසූවියස් / පේලි / එට්නා)

- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** කපුපිළි කර්මාන්තය කෘෂිපාදක අමුද්‍රව්‍ය මත පදනම් වී ඇත. (නි) / වැ

**7.** මිරිදිය ජලයෙන් 79% ක් අයිස් තට්ටු හා ග්ලැසියර් වේ. (නි) / වැ

**8.** ශ්‍රී ලංකාවේ මිනිරන් නිෂ්පාදනයෙන් 3% ක් පමණ දේශීය පරිභෝජනයට යොදාගනු ලැබේ. (නි) / වැ

**9.** නැගෙනහිර ආසියාතික වෙරළට ඔබ්බෙන් වූ පැසිපික් සාගරයේ ඇතිවන සුළිසුළං 'විලිවිලීස්' නමින් හඳුන්වයි. නි / (වැ)

**10.** දඹදෙණිය බුලත් අපනයනය සඳහා දියුණු කරන ලද අපනයන ගම්මානයකි. නි / (වැ)

- අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** මයික්‍රෝ වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලාව ......පොල්ගහවෙල...... ප්‍රදේශයේ පිහිටා ඇත.

**12.** ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාප අතර ඇති කුඩාම සංචාරක කලාපය ......කොළඹ නගරය...... යි.

**13.** කිරිගව සම්පත් මධ්‍යස්ථානය ..........**මීවනපලාන**.......... ප්‍රදේශයේ පිහිටුවා ඇත.


**14.** පෘථිවි ශිලාගෝලය විශාල භූ තැටි ..........**07 / හත**.......... කින් සමන්විත වේ.

**15.** වලාකුළු සහ අවකාශය අතර සිදුවන විදුලි විසර්ජනය ..........**වායු අකුණු / වා අකුණු**.......... ලෙස හඳුන්වයි.

**16.** ගංමෝය හා කලපු ආශ්‍රිත ව ..........**කිවුල් දිය / ලදදිය**.......... ධීවර කර්මාන්තය සිදු කරයි.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.

**ආර්ථික කටයුතුවල නිරත නොවන ජනගහනය පළාත් අනුව - 2012**




මූලාශ්‍රය : ජන සංගනන වාර්තාව, 2012

**17.** ආර්ථික කටයුතුවල නිරත නොවන ඉහළ ම ජන සංඛ්‍යා ප්‍රතිශතය ..........**බස්නාහිර**.......... පළාතෙන් වාර්තා වේ.

**18.** ආර්ථික කටයුතුවල නිරත නොවන අවම ජන සංඛ්‍යා ප්‍රතිශතයක් ඇත්තේ ..........**ඌව**.......... පළාතේ ය.

**19.** උතුරු හා උතුරු මැද පළාත්වල ආර්ථික කටයුතුවල නිරත නොවන මුළු ජන සංඛ්‍යා ප්‍රතිශතය ..........**12%**.......... කි.

- අංක **20** සිට **24** තෙක් දී ඇති ප්‍රශ්නවල **'අ'** සහ **'ආ'** යනුවෙන් තීරු දෙකක් දැක්වේ. **'අ'** තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව **'ආ'** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

**20.**

| **'අ'** **විල** | **'ආ'** **විශේෂත්වය** |
|---|---|
| 1. සුපීරියර් | A - උසින් ම පිහිටි විල |
| 2. ටිටිකාකා | B - කරදිය පිරුණු විල |
| 3. කැස්පියන් | C - විශාලත ම විල |
| | D - ගැඹුරු ම මිරිදිය විල |

(1) A, B, C (2) A, B, D (3) C, A, B (4) D, A, C (....**3**....)

**21.**

| **'අ'** **බෝග වගාව** | **'ආ'** **ඉහළ ම ව්‍යාප්ති දිස්ත්‍රික්කය** |
|---|---|
| 1. රබර් | A - මාතර |
| 2. තේ | B - කළුතර |
| 3. පොල් | C - නුවරඑළිය |
| | D - කුරුණෑගල |

(1) A, C, D (2) B, C, D (3) C, B, D (4) D, C, B (....**2**....)

22. 'අ' 'ආ'

| 'අ' ක්ෂේත්‍රය | 'ආ' ප්‍රවණතාව |
|---|---|
| 1. නිෂ්පාදනය | A - අතුරු බෝග වගාව |
| 2. තාක්ෂණය | B - එකෝසවුන්ඩර් (Echo Sounder) භාවිතය |
| 3. වෙළඳාම | C - කෘෂි වසංගත |
| | D - නවීන ඇසුරුම් ක්‍රම භාවිතය |

(1) A, B, D (2) B, C, D (3) C, B, A (4) C, B, D (…1…)

23.

| 'අ' පාෂාණ වර්ගය | 'ආ' භාවිතය |
|---|---|
| 1. නයිස් | A - පොහොර නිෂ්පාදනය |
| 2. හුණුගල් | B - ප්‍රතිමා නිර්මාණය |
| 3. මිනිරන් | C - සිමෙන්ති නිෂ්පාදනය |
| | D - ලිහිසි ද්‍රව්‍ය නිෂ්පාදනය |

(1) A, C, D (2) B, C, D (3) C, A, B (4) D, C, B (…2…)

24.

| 'අ' ඛනිජ වැලි වර්ගය | 'ආ' ව්‍යාප්ත ප්‍රදේශ |
|---|---|
| 1. ඉල්මනයිට් | A - මීරිගම |
| 2. සර්කෝන් | B - නිලාවෙලි |
| 3. සිලිකා | C - මාරවිල |
| | D - පුල්මුඩේ |

(1) A, B, C (2) B, C, D (3) C, A, B (4) D, A, C (…4…)

- අංක **25** සිට **36** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

**25.** ශ්‍රී ලංකාවේ පාංශු වර්ධන ක්‍රියාවලියේ දී වැදගත් ම වන සාධකය දැක්වෙන වරණය තෝරන්න.
(1) වර්ෂාපතන ප්‍රමාණය (2) වෘක්ෂලතා වැස්ම
(3) භූ විෂමතාව (4) ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය
(…1…)

**26.** සංවර්ධනය මැනීම සඳහා භාවිත කළ පැරණි මිනුමක් වන්නේ,
(1) ප්‍රතිශීර්ෂ දළ ජාතික නිෂ්පාදිතය යි. (2) භෞතික ජීවන තත්ත්ව දර්ශකය යි.
(3) මානුෂ සංවර්ධන දර්ශකය යි. (4) මානුෂ පීඩක දර්ශකය යි.
(…1…)

**27.** ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධන ව්‍යාපෘතියකට අයත් වැඩසටහනක් දැක්වෙන වරණය මින් කුමක් ද?
(1) ඇහළුම් කම්හල් 200 ව්‍යාපෘතිය (2) දිවිනැගුම ව්‍යාපෘතිය
(3) ප්‍රජා මූලික ජල ව්‍යාපෘතිය (4) පැල්පත් ඉවත් කිරීමේ වැඩසටහන
(…4…)

**28.** ලෝහමය ඛණිජ, ඉන්ධනමය ඛණිජ සහ ලෝහමය නොවන ඛණිජ නිවැරදි ව පිළිවෙළින් අඩංගු වරණය වන්නේ මින් කුමක් ද?
(1) මැංගනීස්, ගල් අඟුරු, මිනිරන් (2) යපස්, ගල් අඟුරු, මැංගනීස්
(3) යපස්, හුණුගල්, තඹ (4) තඹ, ඛනිජ තෙල්, සිලිකා
(…1…)

**29.** ජෛව විවිධත්වය හීන වී පස නිසරු වීමට බලපාන ප්‍රධානත ම හේතුවක් වන්නේ,
(1) ඛණිජ ලබා ගැනීම සඳහා පතල් කැණීමයි. (2) ඒක බෝග වගාව සිදු කිරීම යි.
(3) අවිධිමත් ලෙස ජනාවාස ඉදි කිරීම යි. (4) ප්‍රති වන වගා වැඩසටහන් සිදුකිරීම යි.
(…2…)

**30.** නිවර්තන වර්ෂා වනාන්තර ව්‍යාප්ත ව **නොමැති** ප්‍රදේශයක් අඩංගු වන වරණය කුමක්ද?
(1) ඇමසන් ද්‍රෝණිය (2) මධ්‍යම ඇමරිකාව
(3) දකුණු චීනය (4) කොංගෝ ද්‍රෝණිය
(…3…)

**31.** රේගු, ධීවර, සංක්‍රමණ හා සනීපාරක්ෂක නීතිරීති කඩ කිරීම වැළැක්වීම සඳහා රජයට පූර්ණ අයිතියක් ඇති සාගර කලාපය වන්නේ,

(1) ඓතිහාසික ජල ප්‍රදේශය යි. (2) රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශය යි.
(3) පරම ආර්ථික කලාපය යි. (4) යාබද කලාපය යි. (…4…)

**32.** පහත සඳහන් ප්‍රකාශ හා සම්බන්ධ නිවැරදි වරණය කුමක්ද?

A - ශාක පත්‍ර තුළ ඇති ජලය වාෂ්පීකරණයට ලක් වී ඉහළ නගියි.
B - වර්ෂණය මගින් ලැබෙන ජලය සම්පූර්ණයෙන් ම අපධාවයට ලක් වේ.
C - ළිං පෝෂණය කරන්නේ අපධාවය වන ජලය යි.
D - ජල චක්‍රය තුළ ජලය ඝන, ද්‍රව සහ වායු වශයෙන් පැවතිය හැකි ය.

(1) A පමණක් නිවැරදි ය. (2) A සහ C පමණක් නිවැරදි ය.
(3) B සහ D පමණක් නිවැරදි ය. (4) D පමණක් නිවැරදි ය. (…4…)

**33.** මුළු ගොඩබිම් ප්‍රමාණයෙන් 20% කට ආසන්න ප්‍රතිශතයක් ඇති මහාද්වීපය වන්නේ මින් කුමක් ද?

(1) ආසියාව (2) අප්‍රිකාව
(3) යුරෝපය (4) උතුරු ඇමරිකාව (…2…)

**34.** ලෝකයේ කිරිපට්ටි පාලනය බහුල ව සිදු කෙරෙන යුරෝපා රටක් දැක්වෙන වරණය තෝරන්න.

(1) ඉතාලිය (2) පෘතුගාලය
(3) ඩෙන්මාර්කය (4) බල්ගේරියාව (…3…)

**35.** ඇ. එ. ජනපදයේ මෝටර් රථ නිෂ්පාදන මධ්‍යස්ථාන පමණක් දැක්වෙන පිළිතුර දැක්වෙන වරණය තෝරන්න.

(1) ඩෙට්රොයිට්, නව එංගලන්තය, පිට්ස්බර්ග්
(2) කුෂ්නෙට්ස්ක්, මොස්කව්, යූරල් කලාපය
(3) බර්මිංහැම්, දකුණු වේල්සය, ලැන්කෂයර්
(4) ග්ලාස්ගෝ, ෂංහුවාන්, කියොතෝ (…1…)

**36.** බස්නාහිර පළාතේ ඇති වී පර්යේෂණායතනයක් වන්නේ මින් කුමක් ද ?

(1) ගන්නෝරුව (2) බතලගොඩ
(3) මහඉලුප්පල්ලම (4) බෝඹුවල (…4…)

- පහත **A , B , C** සහ **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **37** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A** - 1. පාරිසරික සමතුලිතතාව
2. වන විනාශය

**B** - 1. මුහුදු මට්ටමේ සිට උස
2. වායු පීඩනය

**C** - 1. පුනර්ජනනීය බලශක්ති
2. න්‍යෂ්ඨික අත්හදා බැලීම්

**D** - 1. මානව ක්‍රියාකාරකම්
2. ආපදාවල තීව්‍රතාව

**37.** දෙවැන්නේ වැඩිවීම සඳහා පළමුවැන්නේ අඩු වීම බලපාන මාතෘකා යුගලය දැක්වෙන පිළිතුර මින් කුමක් ද?

(1) A (2) B (3) C (4) D (…2…)

**38.** පළමුවැන්න වැඩි වන විට දෙවැන්න වැඩි වන සහ පළමුවැන්න අඩු වන විට දෙවැන්න අඩු වන මාතෘකා යුගලය මින් කුමක් ද?

(1) A (2) B (3) C (4) D (…4…)

**39.** දෙවැන්නේ අඩු වීම පළමුවැන්නේ වැඩි වීමට බලපාන මාතෘකා යුගලය වන්නේ මින් කුමක් ද?

(1) A (2) B (3) C (4) D (…1…)

**40.** පළමුවැන්න සහ දෙවැන්න අතර සබඳතාවක් නොමැති මාතෘකා යුගලය මින් කුමක් ද?

(1) A (2) B (3) C (4) D (…3…)

❁ ❁ ❁ ❁

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 61 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2024 (2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - மாதிரித் தேர்வுத் தாள் - 2024 (2025)**
**G. C. E. Ordinary Level Examination – Model Question Paper - 2024 (2025)**

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

**භූගෝල විද්‍යාව II**

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- I කොටසේ **01** ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

## I කොටස

1. **(අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.**

- අංක **(i)** හා **(iv)** දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

**i.** අංක ① න් දැක්වෙන ස්වාභාවික වෘක්ෂලතා වර්ගය වන්නේ මින් කුමක් ද?
(තෘණ බිම / වගුරු බිම / කඩොලාන) (ලකුණු 01)

**ii.** අංක ② න් දැක්වෙන රේඛාව කුමක් ද?
(සම ගැඹුරු රේඛාව / සම වර්ෂා රේඛාව / සමෝච්ඡ රේඛාව) (ලකුණු 01)

**iii.** අංක ③ න් දක්වා ඇති පරිපාලන මායිම කුමක් ද ?
(දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස / ග්‍රාම නිලධාරී කොට්ඨාස) (ලකුණු 01)

**iv.** සිතියම් ප්‍රදේශය තුළ රෝස වර්ණයෙන් නිරූපණය කර ඇත්තේ කුමන ලක්ෂණයක් ද?
(රක්ෂිත ප්‍රදේශ / ඉදිකළ ප්‍රදේශ / ආයෝජන කලාප) (ලකුණු 01)

**v.** අංක ④ න් දැක්වෙන ලක්ෂණය කුමක් ද ? (ලකුණු 01)

**vi.** අංක ⑤ සලකුණින් දක්වා ඇත්තේ කුමක් ද? (ලකුණු 01)

**vii.** අංක ⑥ න් දැක්වෙන බෝග වර්ගය නම් කරන්න. (ලකුණු 01)

**viii.** අංක ⑦ චතුරස්‍රයෙන් දක්වා ඇති කොටස තුළ සිදු කළ හැකි ආර්ථික කටයුත්තක් නම් කරන්න. (ලකුණු 01)

- පහත ප්‍රකාශ නිවැරදි නම් **'නි'** යන්න ද, වැරදි නම් **'වැ'** යන්න ද පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න.

**ix.** සිතියම් ප්‍රදේශය තුළ බහුතරයක් ඉස්ලාම් ආගමිකයන් වාසය කරයි. (ලකුණු 01)

**x.** අංක ⑧ චතුරස්‍රය තුළ රේඛීය ජනාවාස ව්‍යාප්ත ව ඇත. (ලකුණු 01)

**(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.**

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

**(i)** කැලිෆෝනියා - A - B - C

**(ii)** ටිමෝර් මුහුද - D - E - F

**(iii)** කයිරෝ නගරය - G - H - I

**(iv)** තස්මේනියාව - K - L - M

**(v)** ක්‍රැකටෝවා යමහල - P - Q - R

**(ඉ)** ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර**,** පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**.** පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න**.**

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.


**(i)** මාතලේ දිස්ත්‍රික්කය - A - B - C

**(ii)** ආරුගම්බේ වෙරළ - D - E - F

**(iii)** ලක්විජය තාප බලාගාරය - G - H - I

**(iv)** පලාලි ගුවන් තොටුපල - L - M - N

**(v)** මිද්දෙනිය - P - Q - R




Scale 1:50,000

අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2024 (2025)

හූගෝල විද්‍යාව - II

**Geography - II**

1· (අ)

(i) වගුරු බිම

(ii) සම ගැඹුරු රේඛාව

(iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය

(iv) ඉදි කළ ප්‍රදේශය

(v) තුඩුව

(vi) අක්ෂාංශ හා දේශාංශ කැපී යන / ඡේදනය වන ස්ථානය

(vii) වෙනත් වැව්ලි


(viii) ධීවර කර්මාන්තය / සංචාරක කර්මාන්තය

(ix) වැ

(x) නි

/10

(ආ)




(i) C

(ii) E


(iii) H

(iv) K

(v) Q

5

(ඉ)




(i) A

(ii) F

(iii) I


(iv) M

(v) Q

5

1. අ. $\frac{}{10}$ + ආ. $\frac{}{5}$ + ඉ. $\frac{}{5}$ = $\frac{}{20}$

**II කොටස**

| | | |
|---|---|---|
| **2.** | **පෘථිවි වායුගෝලයේ ස්තර දැක්වෙන පහත රූපසටහන ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**<br><br><br>**(i) මෙම රූපසටහනට අනුව A හා D ස්තර දෙක නම් කරන්න.**<br>A – පරිවර්තිගෝලය<br>D – තාපගෝලය<br>**නිවැරදි ව නම් කර ඇත්නම් ලකුණු 1 බැගින් x 2** | **(ලකුණු 02 යි)** |
| | **(ii) (a) අහිතකර සූර්ය විකිරණ පාලනය කරන වායුව අන්තර්ගත වන ස්තරයේ අක්ෂරය හා නම නිවැරදි ව සඳහන් කරන්න.**<br>- B - අපරිවර්තිගෝලය<br>**අක්ෂරය හා නම නිවැරදි ව දක්වා ඇත්නම් ලකුණු ½ බැගින් x 2 - ලකුණු 1** | |
| | **(b) 'C' ස්තරයේ විශේෂ ලක්ෂණ දෙකක් දක්වන්න.**<br>- උස සමග උෂ්ණත්වය ක්‍රමයෙන් අඩු වීම<br>- ජල වාෂ්ප, වලාකුළු, දූවිලි අංශු නොමැත<br>- වායුගෝලයේ අඩු ම උෂ්ණත්වය ඇති ස්ථරය වීම ($-90^0$ C)<br>- විද්‍යුත් ක්‍රියාවලි බහුල වීම<br>- මෙසෝ ගෝලයේ ඉහළ සීමාව මෙසෝ මණ්ඩලය යි<br>**යනාදී වශයෙන් මෙසෝගෝලයේ ලක්ෂණ 2 ක් නිවැරදි ව දක්වා ඇත්නම් ලකුණු 1 බැගින් x 2** | **(ලකුණු 03 යි)** |
| | **(iii) වායුගෝලය දූෂණය වීමට බලපාන ස්වාභාවික ක්‍රියාවලියක් හා මානුෂ ක්‍රියාවලි දෙකක් නම් කර, ඉන් එකක් පැහැදිලි කරන්න.**<br>• <u>ස්වාභාවික ක්‍රියාවලි</u><br>- ගිනිකඳු පිපිරීම ආශ්‍රිත විවිධ වායු වර්ග නිකුත් වීම<br>- වගුරු බිම් ආශ්‍රිත මීතේන් වායුව නිකුත් වීම<br>- ලැව්ගිනි<br>• <u>මානව ක්‍රියාවලි</u><br>- කර්මාන්තවලින්, වාහනවලින් පිටවන දුම් (පොසිල ඉන්ධන දහනය)<br>- වන විනාශය<br>- කාර්මීකරණය<br>- කෘෂිකර්මාන්තයේ දී යන්ත්‍ර සූත්‍ර භාවිතය හා රසායනික ද්‍රව්‍ය භාවිතය<br>- සත්ත්ව පාලනය<br>**ස්වාභාවික ක්‍රියාවලියක් නම් කිරීමට ලකුණු 1**<br>**මානව ක්‍රියාවලි දෙකක් නම් කිරීමට ලකුණු 2**<br>**ස්වාභාවික හෝ මානව ක්‍රියාවලියක් විස්තර කිරීමට ලකුණු 2** | **(ලකුණු 05 යි)** |

| 3. | | |
|---|---|---|
| | **(i) කිරි ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන වර්ග දෙකක් නම් කරන්න.**<br>- චීස් - මුදවපු කිරි<br>- චොක්ලට් - කල් කිරි<br>- බටර් - ජීවානුහරණය කළ කිරි<br>- අයිස්ක්‍රීම් - විවිධ රස කළ කිරි<br>- යෝගට් - ගිතෙල්<br>- කිරිපිටි<br>**මෙවැනි අගය එකතු කළ නිෂ්පාදන දෙකක් නම් කිරීමට ලකුණු 1 බැගින් x 2** | **(ලකුණු 02 යි)** |
| | **(ii) සෞම්‍ය කලාපීය රටවල කිරිපට්ටි පාලනය වැඩි වශයෙන් ව්‍යාප්ත වීමට බලපා ඇති සාධක තුනක් දක්වන්න.**<br>- තණබිම්වල ව්‍යාප්තිය<br>- නව තාක්ෂණය<br>- ජල පහසුව<br>- වෙළඳපොල<br>- පුහුණු ශ්‍රමය<br>- වෙනත් වගාවන් සඳහා යොදාගත නොහැකි ආන්තික බිම් පැවතීම<br>**යනාදී සාධක තුනක් දැක්වීමට ලකුණු 1 බැගින් x 3** | **(ලකුණු 03 යි)** |
| | **(iii) (a) වර්තමාන ශ්‍රී ලංකාවේ ධීවරයන් මුහුණ දෙන ගැටළු දෙකක් සඳහන් කරන්න.**<br>- ආපදා තත්ත්වයන් මත ඇති වන ගැටලු<br>- ප්‍රවාහන වියදම් අධික වීම<br>- ආම්පන්නවල මිල අධික වීම<br>- ඉල්ලුමට අනුව සැපයුම ප්‍රමාණවත් නොවීම<br>**යනාදී ගැටළු දෙකක් දැක්වීමට ලකුණු 1 බැගින් x 2** | |
| | **(b) ධීවර කර්මාන්තය නගා සිටුවීම ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත්වන ආකාර දෙකක් පැහැදිලි කරන්න.**<br>- මාළු අපනයනය මගින් විදේශ විනිමය උපයාගත හැකි වීම<br>- දේශීය වශයෙන් ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියා බිහි වීම<br>- කිවුල්දිය ධීවර කර්මාන්තය ආශ්‍රිතව සංචාරක රැකියා බිහි වීම<br>- වැව් ගම්මානවල ජනතාවට ආදායම් ලැබීම<br>**ආර්ථිකයට වැදගත්වන ආකාර දෙකක් පැහැදිලි කිරීමට ලකුණු 1 ½ බැගින් x 2 - ලකුණු 3** | **(ලකුණු 05 යි)** |

**4.**

**(i) එකලස් කිරීමේ කර්මාන්තයක් යනු කුමක් දැයි හඳුන්වන්න.**

කිසියම් නිෂ්පාදනයකට අවශ්‍ය විවිධ කොටස් විශේෂ ප්‍රාගුණ්‍ය යටතේ විවිධ ස්ථානවල හෝ රටවල්වල නිපදවා එම කොටස් එක් ස්ථානයකට රැස් කොට භාණ්ඩයක් නිෂ්පාදනය කරන කර්මාන්ත වේ.

**මෙවැනි නිවැරදි පැහැදිලි කිරීමකට ලකුණු 2** **(ලකුණු 02 යි)**

**(ii) වර්තමානයේ මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රමුඛ ආසියාතික රටවල් තුනක් නම් කරන්න.**

-චීනය
-ජපානය
-දකුණු කොරියාව
-ඉන්දියාව

**මින් රටවල් තුනක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් x 3** **(ලකුණු 03 යි)**

**(iii) (a) ශ්‍රී ලංකාවේ මෝටර් රථ කර්මාන්තය මුහුණ දෙන අභියෝග දෙකක් සඳහන් කරන්න.**

- ඉහළ තාක්ෂණික ශිල්පක්‍රම නොතිබීම
- තාක්ෂණය පිළිබඳ ගැටලු
- ආනයනික මෝටර් රථ සමග තරගය
- ප්‍රාග්ධන හිඟය
- ප්‍රධාන කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත නොවීම

**යනාදී අභියෝග දෙකක් සඳහන් කිරීමට ලකුණු 1 බැගින් x 2**

**(b) ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කර්මාන්ත අංශයෙන් ලැබෙන දායකත්වය පහත මාතෘකා දෙක යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න.**

- **සේවා නියුක්තිය**
- **විදේශ විනිමය ඉපැයීම**

- සේවා නියුක්තිය
  - 2012 වන විට සේවා නියුක්තිය මිලියන 2.1 පමණ වේ
  - 31.4% සේවා නියුක්තිය ප්‍රතිශතයක් තිබීම
  - ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියා ප්‍රමාණය ඉහළ යාම


- විදේශ විනිමය ඉපැයීම
  - සමස්ත අපනයන ඉපැයීම්වලින් 75.4% පමණ වීම
  - ඉහළම විදේශ විනිමය උපයන කාර්මික අංශය ඇඟලුම් ක්ෂේත්‍රය වීම (41%)
  - ඉහළ විදේශ විනිමය මැණික් ස්වර්ණාභරණ කර්මාන්තය ඉහළ වීම

**එක් අංශයකින් එක් කරුණු බැගින් කෙටියෙන් පැහැදිලි කිරීමට ලකුණු 1 ½ බැගින් x 2 - ලකුණු 3** **(ලකුණු 05 යි)**

| | | |
|---|---|---|
| **5.** | **(i) ලෝක ජන සංඛ්‍යාව පිළිබඳ සලකා බැලීමේ දී මිනිසාට,**<br>**(a) උපතින් හිමිවන ලක්ෂණයක්,**<br>**(b) උපතින් පසු උරුම කරගනු ලබන ලක්ෂණයක් බැගින් නම් කරන්න.**<br><br>a. පුම්තිරි බව / මානව වර්ගය / වයස<br>b. ජාතිය / ආගම / භාෂාව / සාක්ෂරතාව<br><br>**එක් ලක්ෂණය බැගින් නිවැරදි ව නම් කර ඇත්නම් ලකුණු 1 බැගින් x 2** | **(ලකුණු 02 යි)** |
| | **(ii) ලෝකයේ ජනාධික කලාප බිහිවීමට බලපෑ සාධක තුනක් නම් කරන්න.**<br><br>- මිනිස් වාසයට හිතකර භෞතික පරිසරයක් තිබීම<br>- භූ විෂමතාව<br>- දේශගුණය<br>- ජල පහසුව<br>- සාරවත් පස ආදිය<br>- ගමනාගමන පහසුව<br>- වෙළඳාම හා වෙනත් ආර්ථික ක්‍රියාවන්ට යෝග්‍ය වීම<br><br>**යනාදී ලක්ෂණ තුනක් නිවැරදි ව නම් කර ඇත්නම් ලකුණු 1 බැගින් x 3** | **(ලකුණු 03 යි)** |
| | **(iii) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහයේ හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ දෙකක් නම් කර, ඉන් එක් කරුණක් රටේ ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.**<br><br>- වැඩිහිටි ජන සංඛ්‍යාව වැඩි වීම<br>- බාල වයස් ජන සංඛ්‍යාව පහළ බැසීම<br>- ස්ත්‍රී ජන සංඛ්‍යාව වැඩි වීම<br><br>**යනාදි ලක්ෂණ දෙකක් නිවැරදිව දැක්වීමට ලකුණු 1 බැගින් x 2 - ලකුණු 2**<br>**එක් කරුණක් නිවැරදි ව විස්තර කිරීමට ලකුණු 3** | **(ලකුණු 05 යි)** |

| | | |
|---|---|---|
| **6.** | **(i) ශ්‍රී ලංකාවේ ජල ගැලීම්වලට නිරතුරුව ම ලක්වන ගංගා ආශ්‍රිත නාගරික ප්‍රදේශ දෙකක් නම් කරන්න.**<br><br>- කොළඹ<br>- කළුතර<br>- මාතර<br>- රත්නපුර<br><br>**ගංගා ආශ්‍රිත මෙවැනි නාගරික ප්‍රදේශ දෙකක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් x 2** | **(ලකුණු 02 යි)** |
| | **(ii) ජලගැලීම් ආපදාව අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් දක්වන්න.**<br><br>- ගංගාවල වැලි ගොඩ දැමීම සීමා කිරීම<br>- ගංගා පෝෂක ප්‍රදේශවල වනාන්තර ආරක්ෂා කර ගැනීම<br>- ගං මෝය විවෘතව තබා ගැනීම<br>- පහත් බිම් හා තෙත් බිම් ආරක්ෂා කිරීම<br>- ජල ගැලීම්වලට ඔරොත්තු දෙන ඉදිකිරීම්වලට යොමු වීම<br>- පිටාර ගැලීම් සිදුවන ස්ථානවල මානව කටයුතු සීමා කිරීම<br>- ආරක්ෂිත ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රජාව දැනුම්වත් කිරීම<br><br>**යනාදී ක්‍රියාමාර්ග තුනක් නම් කිරීමට ලකුණු 1 බැගින් x 3** | **(ලකුණු 03 යි)** |
| | **(iii) ජලගැලීම් අවස්ථාවක දී ආපදා කළමනාකරණ චක්‍රයේ ප්‍රතිචාර දැක්වීමේ අවස්ථාව තුළ අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් උදාහරණ සහිත ව කෙටියෙන් විස්තර කරන්න.**<br><br>- වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම<br>- ආපදාවට ගොදුරු වූ ප්‍රජාවගේ ආරක්ෂාව සහතික කිරීම<br>- භෞතික දේපළ හැකි පමණ ආරක්ෂා කර ගැනීම<br>- තාවකාලික නිවාස ලබා දීම<br>- ආහාර පාන හා පිරිසිදු ජලය සපයා දීම<br><br>**යනාදී ක්‍රියාමාර්ග දෙකක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් x 2 - ලකුණු 4**<br>**උදාහරණ දැක්වීමට ලකුණු 1** | **(ලකුණු 05 යි)** |

**7.** **ලෝකයේ දේශගුණික කලාප දැක්වෙන පහත සිතියම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




**(i) ඉහත සිතියමෙ හි 'A' හා 'B' අක්ෂරවලින් දක්වා ඇති දේශගුණ කලාපවලට සුවිශේෂී වූ දේශගුණ වර්ගය බැගින් නම් කරන්න.**

A – මෝසම් දේශගුණය

B – මධ්‍යධරණී දේශගුණය

**සුවිශේෂී දේශගුණ වර්ග දෙක පමණක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් x 2** **(ලකුණු 02 යි)**

**(ii) 'C' දේශගුණ කලාපය තුළ මානව කටයුතු සීමා වීමට හේතු වූ සාධක තුනක් සඳහන් කරන්න.**

- ශීත දේශගුණය
- හිම පතනය
- ජනාවාස ඉදිකිරීමට අපහසු වීම
- කෘෂි කර්මාන්තය කිරීමට ඇති අවකාශ අවම වීම

**යනාදී සාධක තුනක් නිවැරදි ව සඳහන් කිරීමට ලකුණු 1 බැගින් x 3** **(ලකුණු 03 යි)**

**(iii) (a) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා ඇතිවන පාරිසරික බලපෑම් දෙකක් සඳහන් කරන්න.**

- දේශගුණික වෙනස්වීම් / දේශගුණ මායිම් කලාප ඇති වීම
- සත්ත්ව අභිජනන කලාප විනාශ වීම / වෙනස් වීම
- පානීය ජල මූලාශ්‍ර දූෂණය වීම
- ධ්‍රැවීය අයිස් නිධි දිය වී මුහුදු මට්ටම ඉහළ යාම
- කලපු විනාශ වීම හා ජලය ලවණීකරණය වීම
- සාගර ජලයේ උෂ්ණත්වය වැඩි වී ජල ජීවීන් විනාශ වීම
- සාගර මතුපිට උෂ්ණත්වය වැඩි වීම නිසා සුළි කුණාටු තත්ත්වයන් ඇති වීම
- ඇතැම් ජීවීන් වඳ වීම හා නව ගහන බිහි වීම
- සත්ත්ව ජාන විනාශ වීම හා විකෘති වීම

**යනාදී පාරිසරික බලපෑම් දෙකක් සඳහන් කිරීමට ලකුණු 1 බැගින් x 2**

**(b) දේශගුණ වෙනස්වීම් අවම කිරීමට ගෝලීය වශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න.**

- මිහිකත සමුළුව - කියතෝ සම්මුතිය
- පැරිස් ගිවිසුම COP සමුළුව
- දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් ආණ්ඩු මණ්ඩලය

**යනාදී ක්‍රියාමාර්ග දෙකක් විස්තර කිරීමට ලකුණු 1 ½ බැගින් x 2 - ලකුණු 3** **(ලකුණු 05 යි)**

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

8.

**(i) බලශක්තිය නිපදවීම සඳහා ශ්‍රී ලංකාවේ භාවිත කරන ප්‍රධාන බලශක්ති ප්‍රභව දෙකක් නම් කරන්න.**

- ජෛව ස්කන්ධ
- ජලය
- ගල් අඟුරු
- සුළං ශක්තිය
- සූර්ය ශක්තිය
- පෙට්‍රෝලියම් (පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, LP ගෑස් ආදිය)

**යනාදී බලශක්ති ප්‍රභව දෙකක් නම් කිරීමට ලකුණු 1 බැගින් x 2** **(ලකුණු 02 යි)**

**(ii) පහත ගංගා ආශ්‍රිත ව ඉදි කර ඇති විදුලි බලාගාරය බැගින් නම් කරන්න.**

**(a) වලවේ ගඟ**

**(b) ගල් ඔය**

**(c) මහවැලි ගඟ**

a. වලවේ ගඟ - සමනල වැව / උඩවලව

b. ගල් ඔය - ඉඟිනියාගල

c. මහවැලි ගඟ - වික්ටෝරියා / රන්දෙනිගල / රන්ටැඹේ / පොල්ගොල්ල / කොත්මලේ / ඉහළ කොත්මලේ

**එක ගඟකට එක් බලාගාරය බැගින් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් x 3** **(ලකුණු 03 යි)**

**(iii) විකල්ප බලශක්ති භාවිතය රටක සංවර්ධනය කෙරෙහි බලපාන ආකාර දෙකක් නිදසුන් සහිත ව විස්තර කරන්න.**

- ඉන්ධන ආනයනයට වියදම් අඩු වීම (විදේශ විනිමය ඉතිරි වීම)
- නව රැකියා අවස්ථා ඇති වීම
- විදුලිය නොමැති ග්‍රාමීය ප්‍රදේශවල ජීවන තත්ව ඉහළ දැමීමට උපකාරී වීම
- වනාන්තර, ජලාශ ආදිය ආරක්ෂා වීම
- නවෝත්පාදනය පිළිබඳ හැකියාවන් ඉහළ දැමීම

**යනාදී කරුණු දෙකක් නිවැරදි ව විස්තර කිරීමට ලකුණු 2 බැගින් x 4**
**නිදසුන් දැක්වීමට ලකුණු 1** **(ලකුණු 05 යි)**

WWW.PastPapers.WiKi

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]